# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1922/46 – 2015 ජූලි 09 වැනි බ්‍රහස්පතින්දා – 2015.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හෙලඋඩපත්තුව සුළු කොට්ඨාසයේ, පල්ලේවෙල හා ඇල්ලේවත්ත (අ.ග.පි. 470 සහ 471 තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක R/BLN/2014/511 හා 2014.12.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0167 ක් පමණ වන බැංකියාවත්ත නමැති පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

01. කැබලි අක්ෂර 'එච්' – බැංකියාවත්ත – **ප්‍රමාණය: හෙක්. 0.0115**

උතුරට, නැගෙනහිරට සහ දකුණට: මාර්ගය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බැංකියාවත්ත සහ පී. ජී. විමලාවතී හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: පී. ජී. විමලාවතී හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස, හිමිකම් කියන අය සොයාගත නොහැකි බැංකියාවත්ත, කැබලි අක්ෂර ජේ සහ මාර්ගය.

02. කැබලි අක්ෂර 'ජේ' – බැංකියාවත්ත – **ප්‍රමාණය: හෙක්. 0.0018**

උතුරට: මාර්ගය සහ කැබලි අක්ෂර එච්; නැගෙනහිරට: කැබලි අක්ෂර එච්; දකුණට: පී. ජී. විමලාවතී හිමිකම් කියන බැංකියාවත්ත සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි මෙම ඉඩමේ ඉතිරි කොටස.

03. කැබලි අක්ෂර 'කේ' – බැංකියාවත්ත – **ප්‍රමාණය: හෙක්. 0.0034**

උතුරට සහ නැගෙනහිරට: මාර්ගය; දකුණට: මාර්ගය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බැංකියාවත්ත සහ ජී. එම්. නන්දාවතී හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මාර්ගය, ජී. එම්. නන්දාවතී හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බැංකියාවත්ත.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය 4-3/9/2013/WS/689.
2015 ජූනි මස 12 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 1170



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*